GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 011 2580886/ 0718552552 Fax : 011 2503586
Email : office@gmoa.lk Web : www.gmoa.lk

A CENTURY OF HEALING THE NATION
1926 - 2026
GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION


**2026.08.30**

**මාධ්‍ය නිවේදනයයි**

**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය**
**යෝජිත 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධ ප්‍රකාශය**

**උත්තරීතර නීතිය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැවතිය යුතු බව.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය වේ. එබැවින්, එයට සිදුකරන ඕනෑම සංශෝධනයක් ඉතාමත් වගකීමෙන්, විනිවිදභාවයෙන් සහ ප්‍රවේශමෙන් සලකා බැලිය යුතු වන අතර, නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින්, අදාළ සියලු පාර්ශ්වකරුවන් සහ මහජනතාව සමඟ අර්ථවත් සාකච්ඡාවකින් අනතුරුව එය සිදු කළ යුතුය.

**අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම.**

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය (GMOA) දැඩි ලෙස විශ්වාස කරන්නේ අධිකරණයේ ස්වාධීනත්වය, නීති පද්ධතියේ අවංකභාවය සහ නීතියේ ආධිපත්‍යය සෑම අවස්ථාවකදීම උපරිමයෙන්ම ආරක්ෂා විය යුතු බවයි.

**ශ්‍රී ලංකා නීතිඥ සංගමය සමඟ සාකච්ඡා කිරීම**

යෝජිත 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට ලැබුණු ආරාධනාව මත, ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) සමඟ සවිස්තරාත්මක සාකච්ඡා පැවැත් වූ අතර, යෝජිත 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්තා සංශෝධනය ඉදිරිපත් කිරීමේදී අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය සහ එමඟින් ඇතිවිය හැකි බලපෑම් පිළිබඳවද දැනුවත් විය.

**එම ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් පවතින අපගේ අවධානය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේදී, විශේෂයෙන්ම අධිකරණය සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ හැකි කරුණු පිළිබඳව කටයුතු කිරීමේදී අපේක්ෂා කරන මට්ටමේ විනිවිදභාවයක්, පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කිරීමක් සහ එකඟතාවක් ගොඩනැගීමක් රජය විසින් අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය තුළින් ප්‍රමාණවත් ලෙස තහවුරු වී නොමැති බව පෙනීයයි.

අධිකරණය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සම්බන්ධ ඕනෑම ක්‍රියාදාමයක් ස්වාධීන වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, එය පැහැදිලිවම ස්වාධීන මෙන්ම අපක්ෂපාතී බව පෙනී යාමද උපරිම මහජන විශ්වාසයක් ඒ මත රඳවා තබාගැනීමට අත්‍යවශ්‍ය වේ.

**වෘත්තීය සංවිධාන සමඟ එක්ව නැඟී සිටීම**

ඒ අනුව, යෝජිත 22 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරියට ගෙන යාමේදී අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කරමින් , ශ්‍රී ලංකා නීතිඥ සංගමය (BASL) ඇතුළු අනෙකුත් වෘත්තීය සංවිධාන සහ වෘත්තීය සමිති සමඟ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයද එක්ව සිටී.

**විනිවිදභාවයෙන් සහ එකඟතාවයන් මත පදනම් වූ ක්‍රියාදාමයක් අපේක්ෂා කිරීම.**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ඉදිරියට ගෙන යාමට පෙර, අදාළ ක්‍රියාපටිපාටිය නැවත සලකා බලන ලෙසත්, අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ අර්ථවත් සාකච්ඡාවන් පවත්වන ලෙසත්, ප්‍රමාණවත් මහජන සංවාදයක් සඳහා අවකාශ සලසන ලෙසත්, විනිවිදභාවයෙන් සහ පුළුල් එකඟතාවක් මත පදනම් වූ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන ලෙසත් අපි රජයෙන් ඉල්ලා සිටිමු.

**අපගේ ස්ථාවරය**

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මෙම ස්ථාවරය දේශපාලනික කරුණු මත පදනම් වූවක් නොවන අතර, ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පාලනය, අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම සඳහා අප සතු කැපවීම මත පදනම් වේ.

මෙම මූලධර්ම රටේ දිගුකාලීන ස්ථාවරත්වය සහ ජනතාවගේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන බව රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය ඉතසිතින්ම විශ්වාස කරනු ලැබේ.

ස්තුතියි.
මීට විශ්වාසී,

විශේෂඥ වෛද්‍ය චන්දික එපිටකඩුව
සභාපති

වෛද්‍ය යූ. කේ. බී. වරකාගොඩ
ලේකම්.

වැඩිදුර විස්තර රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මාධ්‍ය කමිටුවෙන් -

| | | |
|---|---|---|
| වෛද්‍ය ලසිත ධම්මික (මාධ්‍ය ප්‍රකාශක) | - | 0777611420 |
| වෛද්‍ය ප්‍රභාත් සුගතදාස | - | 0714471066 |
| වෛද්‍ය පාලිත රාජපක්ෂ | - | 0718480300 |
| වෛද්‍ය චමිල් විජේසිංහ | - | 0717080041 |
| වෛද්‍ය හංසමාල් වීරසූරිය | - | 0776549339 |
| වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - | 0716812160 |
| වෛද්‍ය ආර්. තනිගවාසන් | - | 0772369608 |
| වෛද්‍ය තෙනුවන් වික්‍රමසිංහ | - | 0777829001 |
| වෛද්‍ය අජන්ත රාජකරුණා | - | 0766736296 |
| වෛද්‍ය චාරුනි කොහොඹන්ගේ | - | 0714410467 |
| වෛද්‍ය අන්ෆාස් ෆාරුක් | - | 0771115117 |
| වෛද්‍ය සංජීව තල්ගහගොඩ | - | 0716173330 |